# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | විදේශ විනිමය දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2023.07.24 |

## ශ්‍රී ලංකාවෙන් බැහැරට විදේශ විනිමය ප්‍රේෂණය කිරීම් මත පනවා තිබූ යම් සීමා කිරීම්/අත්හිටුවීම් ලිහිල් කරමින් නව නියෝග නිකුත් කිරීම

ගරු මුදල් අමාත්‍යවරයා විසින් විනිමය අනුපාතයට ඇති පීඩනය අවම කිරීම මගින් මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය පවත්වා ගැනීමට සහය වීම සහ රටතුළ පවතින විදේශ විනිමය සංචිත මට්ටම ආරක්ෂා කර ගැනීමේ අරමුණින් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ 2020.04.02 දින සිට වරින් වර ශ්‍රී ලංකාවෙන් බැහැරට විදේශ විනිමය ප්‍රේෂණය කිරීම් තාවකාලිකව සීමා කිරීම්/අත්හිටුවීම් සඳහා නියමයන් නිකුත් කරන ලදී.

දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි වර්තමාන සහ අපේක්ෂිත සංවර්ධනයන් සැලකිල්ලට ගනිමින් සහ ජාත්‍යන්තර ගනුදෙනු වෙනුවෙන් තවදුරටත් පහසුකම් සැලසීමේ අරමුණින් ගරු මුදල් අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ නිර්දේශය සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිත ව විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නව නියමයක් නිකුත් කර ඇත. මෙම නියමය මගින් ප්‍රාග්ධන ගනුදෙනු වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් බැහැරට විදේශ විනිමය ප්‍රේෂණය කිරීම මත පනවා තිබූ යම් යම් සීමා කිරීම්/අත්හිටුවීම් ලිහිල් කිරීම සහ විගාමිකයන්ගේ වර්තන ගනුදෙනු මත පනවා තිබූ සීමා කිරීම් ඉවත් කර ඇති අතර, පෙර නිකුත් කරන ලද නියමය යටතේ පනවා තිබූ අනෙකුත් සීමා කිරීම්/අත්හිටුවීම් තවදුරටත් බලපැවැත්වෙනු ඇත. නව නියමය 2023.06.28 දින සිට මාස හයක (06) කාලයක් සඳහා වලංගු වේ. මෙම ලිහිල් කිරීම් පිළිබඳ සාරාංශයක් පහත වගුවේ දැක්වේ.

| අනු අංකය | විෂය පථය | පෙර නිකුත් කරන ලද නියමය යටතේ සීමාව | නව නියමය යටතේ සීමාව |
|---|---|---|---|
| 1 | සංක්‍රමණික දීමනාවට පළමු වරට හිමිකම් කීම. | එ.ජ.ඩො. 30,000* ක උපරිමයක් දක්වා | එ.ජ.ඩො. 50,000* ක උපරිමයක් දක්වා |
| 2 | සංක්‍රමණික දීමනාවට පළමු වරට හිමිකම් පෑමෙන් පසුව සිදුකරන හිමිකම් පෑම. | එ.ජ.ඩො. 10,000* ක උපරිමයක් දක්වා | එ.ජ.ඩො. 20,000* ක උපරිමයක් දක්වා |
| 3 | සංක්‍රමණිකයන්ගේ වර්තන ආදායම් හෝ සමුච්චිත වර්තන ආදායම් ප්‍රේෂණය කිරීම. | එ.ජ.ඩො. 30,000* ක උපරිමයක් දක්වා | සීමාකිරීම් ඉවත් කර ඇත |
| 4 | සුදුසුකම් ලත් නේවාසික ආයෝජකයන් විසින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් (Outward Investment Account) හරහා කරන විදේශීය ආයෝජනයන්: | | |
| | i. දැනටමත් විදේශයක සංස්ථාපිත/පිහිටුවා ඇති පාලිත සමාගම්වල හෝ ශාඛා කාර්යාලවල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් සිදුකිරීමට නියමිත අමතර ආයෝජනයන්. | එ.ජ.ඩො. 15,000* ක උපරිමයක් දක්වා. | එ.ජ.ඩො. 30,000* ක උපරිමයක් දක්වා. |

| අනු අංකය | විෂය පථය | පෙර නිකුත් කරන ලද නියමය යටතේ සීමාව | නව නියමය යටතේ සීමාව |
|---|---|---|---|
| | ii. තම ප්‍රධාන ව්‍යාපාරය පුළුල් කරගැනීමේ අරමුණින් ශ්‍රී ලංකාවෙන් පිටත ඇති සමාගමක සාමාන්‍ය කොටස්වල ආයෝජනයන්.<br><br>iii. විදේශීය කාර්යාල පිහිටුවීම. | අත්හිටුවන ලදී.<br><br>අත්හිටුවන ලදී. | අ) කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම්; එ.ජ.ඩො. 200,000* ක සීමාවක් දක්වා.<br>ආ) කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගතව නොමැති සමාගම්; එ.ජ.ඩො. 100,000* ක සීමාවක් දක්වා.<br><br>එ.ජ.ඩො. 100,000* සීමාවක් දක්වා. |
| 5 | ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Business Foreign Currency Account) හරහා සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරට ප්‍රේෂණයන්. | එ.ජ.ඩො. 20,000* ක උපරිමයක් දක්වා. | විදේශයන්හි ඇති ප්‍රධාන ව්‍යාපාරය පුළුල් කර ගැනීමේ අරමුණ සඳහා, එ.ජ.ඩො. 100,000* ක උපරිමයක් දක්වා. |
| 6 | විදේශයක සංස්ථාපිත සමාගමක පාලිත සමාගමක් හෝ ශාඛා කාර්යාලයක් වන ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් විසින්, එහි සේවා නියුක්තිකයන් වෙනුවෙන් සේවක කොටස් හිමිකම් සැලසුමකට හෝ සේවක කොටස් වරණීය ක්‍රමයට දායකත්වය දැරීමේ අරමුණින් ශ්‍රී ලංකාවෙන් බැහැරට ප්‍රේෂණයන්. | අත්හිටුවන ලදී. | අත්හිටුවීම ඉවත් කරන ලදී. |

**හෝ වෙනත් ඕනෑම නම් කරන ලද සම්මත විදේශ ව්‍යාවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක්*

වැඩිදුර විස්තර සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.dfe.lk හරහා 2023 ජූනි 28 දිනැති අංක 2338/40 දරන ගැසට් (අති විශෙෂ) නිවේදනයේ පළ කරන ලද නියමය පරිශීලනය කළ හැක.